**ලංකා ධීවර සංස්ථාව - 2015**

**------------------------------**

ලංකා ධීවර සංස්ථාවේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 29 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී )වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**--------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

-----------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ලංකා ධීවර සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------

#### 2.2.1 ආයතනයේ අඛණ්ඩ පැවැත්ම

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාව දිගින් දිගටම අලාභ ලැබීම නිසා ශුද්ධ වත්කම්වලට අහිතකර ලෙස බලපෑම, ආයතනයේ අතිරේක සේවක සංඛ්‍යාවක් පැවතීම හා ඉහළ කළමනාකරණයේ තනතුරුවල සිටින නිලධාරීන් කෙටිකාලීනව වෙනස්වීම යන කාරණා හේතුකොට ගෙන සංස්ථාවේ සැලසුම් නිරන්තරයෙන් වෙනස්වීම මත වූ කාරක ප්‍රාග්ධන අර්බුදයකට මුහුණ දී තිබුණි. ඒ හේතුවෙන් පසුගිය වර්ෂ 05 ක කාලය තුළදී ලංකා ධීවර සංස්ථාවේ වෙළෙඳපොළ තත්ත්වය සියයට 1.1 සිට 0.7 දක්වා අඩුවීම නිසා සංස්ථාවේ පැවැත්මට අහිතකර ලෙස බලපෑම් ඇති වී තිබුණි.

(ආ) සංස්ථාව ප්‍රතිව්‍යුහගත කිරීමට පදනමක් සකස් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමේ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කර තිබුණි. ඒ සඳහා සේවකයන් 126 දෙනෙකු අයදුම්කර තිබූ අතර , රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 02/2016 යටතේ සේවකයන් 109 දෙනෙකුට ඉඩදී තිබුණි. ඒ අතරින් සේවකයන් 102 දෙනෙකු 2016 මැයි 20 දින විශ්‍රාම ගන්වා තිබූ අතර ඒ සඳහා භාණ්ඩාගාරයෙන් රු.මිලියන 110 ක ප්‍රතිපාදන ලැබී තිබුණි. සංස්ථාව ප්‍රතිව්‍යුහගත කිරීම හා ලාභදායී වාණිජමය රාජ්‍ය ව්‍යාපාරයක් බවට පත්කිරීම සඳහා සේවකයින් විශ්‍රාම ගැන්වුවද, එකී අරමුණු ඉටුකර ගැනීම සඳහා වූ නිසි සැලසුම් සකස් කර නොතිබුණි.

#### 2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරන ප්‍රමිත 07

----------------------------------------

මූල්‍ය වත්කම් සහ වගකීම් හඳුනා ගැනීමට අදාළ කරගත්තා වූ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනයන්හි හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01

-----------------------------------

(i) ප්‍රමිතය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසානයට රු.10,075,443 ක් වූ සේවක ආපදා ණය ශේෂය, ජංගම හා ජංගම නොවන වත්කම් ලෙස වර්ගීකරණය නොකර, සමස්ත ශේෂයම ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි.

(ii) ප්‍රමිතය ප්‍රකාරව විදේශ විනිමය අනුපාත වෙනස්වීම් ගැලපීම සම්බන්ධව අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08

-------------------------------------

ඉකුත් වර්ෂයන් සඳහා වූ ගැලපීම් රු.338,936 ක් හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ ඉදිරියට ගෙනෙන ලද ලාභාලාභ ශේෂයට ගලපනවා වෙනුවට සමාලෝචිත වර්ෂයේ ලාභාලාභ ශේෂයට ගලපා තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 17

-------------------------------------

බදු පදනම මත ලබාගන්නා ලද ඉඩම්වල වෙළඳසැල් ස්ථාපිත කිරීම සඳහා දරන ලද රු.20,396,873 ක වියදම අදාළ වත්කම්වල ඵලදායී ජීවකාලය හෝ කල්බදු ගිවිසුමේ සඳහන් කාලය යන දෙකෙන් අඩු කාල පරිච්ඡේදය පදනම් කරගෙන ක්ෂය නොකර වර්ෂ 05 ක් තුළ ක්ෂය වන පරිදි ගිණුම්ගතකර තිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 18

-------------------------------------

ආදායම් හඳුනාගැනීමේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය හෙළිදරව් කර නොතිබුණි.

(ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19

-------------------------------------

ප්‍රවර්තන සේවා පිරිවැය හා පොළී පිරිවැය එකතුව රු.14,294,052 ක් වර්ෂයේ ලාභය හෝ අලාභය හඳුනාගැනීමේදී ගැලපිය යුතු වුවද ආයුගණන අලාභය රු.10,964,641 ක් වෙනත් විස්තීරණ ආදායම් යටතේ ගැලපිය යුතුය. නමුත් සංස්ථාව විසින් ඉහත ආයුගණන අලාභයද ඇතුළත්ව සමාලෝචිත වර්ෂය සඳහා වූ පාරිතෝෂික වියදම් රු.25,258,694 ක් ආදායම් ප්‍රකාශනයට හඳුනාගෙන නැවත එය වෙනත් විස්තීරණ ආදායමක් ලෙස හඳුනාගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අලාභය රු.25,258,694 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 20

-------------------------------------

රාජ්‍ය ප්‍රදාන ගිණුම්ගත කිරීම සම්බන්ධයෙන් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඌ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 38

-------------------------------------

පිරිවැය රු.500,000 ක් වූ වැටුප් සැකසීමේ පරිගණක මෘදුකාංගය අස්පෘෂ්‍ය වත්කමක් ලෙස ගිණුම්ගත නොකර ස්පෘෂ්‍ය වත්කමක් ලෙස ගිණුම්ගතකර තිබුණි.

(එ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 40

-------------------------------------

සංස්ථාව සතු දේපළ බාහිර ආයතනවලට බදු දීම තුළින් සමාලෝචිත වර්ෂයේදී රු.4,695,980 ක ආදායමක් උපයා තිබුණද එම ආයෝජන දේපළ, මූල්‍ය ප්‍රකාශනවල වෙනම වත්කමක් ලෙස අනාවරණය කර නොතිබුණි.

## 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වත්කම් ප්‍රත්‍යාගණනය තුළින් ඇති වූ අතිරික්ත වටිනාකම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා වූ ක්ෂය වීම් රු.45,328,629 ක් , ප්‍රත්‍යාගණන සංචිතයට එරෙහිව කපාහැර තිබුණි. මේ හේතුවෙන් ආදායම් ප්‍රකාශනයේ සමාලෝචිත වර්ෂය සඳහා වූ ක්ෂය වියදම එම අගයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයේදී කෙරීගෙන යන වැඩ යටතේ හඳුනාගෙන තිබූ එකතුව රු.3,380,094 ක් වූ ගිණුම් ශේෂයන් 02 ක්, සමාලෝචිත වර්ෂයේදී අනුචිතව විවිධ ණයගැතියන් යටතේ හඳුනාගෙන තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාළ රු.24,644,759 ක් වූ ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය , ආදායම් ප්‍රකාශනයේ වෙනත් ආදායම් ලෙස හඳුනා නොගෙන සමාලෝචිත වර්ෂයේ ක්ෂය වියදමෙන් අඩුකර මූල්‍ය ප්‍රකාශනවලට ගැලපුම් කර තිබුණි.

## 2.2.4 නොසැසඳූ පාලන ගිණුම්

--------------------------

සංස්ථාව හා අලෙවි විධායකයන් අතර ගනුදෙනු සම්බන්ධයෙන් වූ ජංගම ගිණුම් සමාලෝචිත වර්ෂය අවසානයේදී සැසඳුම් කර ගැලපීම් නොකිරීම හේතුවෙන් ජංගම ගිණුම් 57 ක රු.27,760,665 ක් වූ වෙනස වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීම් කර තිබුණි.

## 2.2.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

------------------------------------------------------------

ජංගම නොවන වත්කම් යටතේ අපහරණය කළ යුතු වත්කම් ලෙස හඳුනාගෙන තිබූ භෞතිකව නොපැවති වටිනාකම රු.5,202,867 ක් වූ වත්කම් සමාලෝචිත වර්ෂය තුළදී විධිමත් අනුමැතියකින් තොරව පෙර වර්ෂ ගැලපීම් ලෙස කපාහැර තිබුණි.

## 2.2.6 විගණනය සඳහා සාක්ෂි නොවීම.

-----------------------------------

සමාලෝචිත වර්ෂය අවසානයට රු.335,698,363 ක් වූ වෙළඳ ණයහිමියන් හා රු.251,356,107 ක් වූ වෙළඳ ණයගැතියන් සම්බන්ධයෙන් කාල විශ්ලේෂණ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-------------------------------------

මඩකලපුව සහ මතුගම මාළු වෙළඳසැල් ඉදිකිරීමට දෙන ලද අත්තිකාරම් රු.540,000 ක් වසර 02 ක කාලයක සිට නිරවුල් කර නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| | නීති රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනත | පනතේ ප්‍රතිපාදන වලින් බැහැරව උප සභාපතිවරයෙකු පත්කර සමාලෝචිත වර්ෂයේ අප්‍රේල් සිට දෙසැම්බර් දක්වා මාසිකව රු.65,000 බැගින් රු.520,000 ක් හා වාහනයක් සමඟ ඉන්ධන සඳහා රු.83,540 ක් ගෙවා තිබුණි. |
| (ආ) | 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.4 ඡේදය | සංස්ථාවේ සේවකයන් රේඛීය අමාත්‍යාංශයට හෝ වෙනත් ආයතනයකට නිදහස් කරන්නේ නම් ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගත යුතු වුවද, ඊට පටහැනිව නිලධාරින් හා සේවකයන් 12 දෙනෙකු බාහිර ආයතන වෙත මුදාහැර සමාලෝචිත වර්ෂය තුළදී රු.840,370 ක් වැටුප් හා වේතන ලෙස ගෙවා තිබුණි. |

## 3 . මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ මූල්‍ය ප්‍රතිඵලය රු.259,917,474 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.119,187,790 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.140,729,684 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. භාණ්ඩාගාරය වෙතින් ලද ප්‍රතිපාදන රු.57,769,995 කින් වැඩිවී තිබුණද විකුණුම් පිරිවැය රු.209,298,089 කින් අඩුවී තිබියදී විකුණුම් ආදායම රු.343,583,159 කින් අඩුවීම හා බෙදාහැරීම් , මූල්‍ය හා අනෙකුත් වියදම් රු.39,477,499 කින් අඩුවුවද පරිපාලන වියදම් රු.93,700,683 කින් වැඩිවීම ඉහත පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ දී රු.68,969,869 ක්වූ ඌනතාවය 2012 වර්ෂයේ දී රු.41,763,563 දක්වා අඩු වී 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය තෙක් රු.259,917,474 දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි. සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් ගැලපීමෙන් පසු 2011 වර්ෂයේ දී රු.426,724,880 ක් වූ එකතුකළ අගය 2014 වර්ෂය දක්වා රු.374,762,457 තෙක් අඛණ්ඩව වර්ධනය වී තිබුණු අතර 2015 වර්ෂයේ දී රු.370,771,174 දක්වා අඩු වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පසුගිය වර්ෂ 5 ක් තුළ ලබා ඇති ශුද්ධ අලාභය රු.මිලියන 344 ක් වූ අතර ,සමාලෝචිත වර්ෂය අවසානයේදී ශුද්ධ අලාභය රු.මිලියන 259 ක් විය. ඉකුත් වර්ෂය හා සැසඳීමේදී ශුද්ධ අලාභය සියයට 118 කින් වැඩිවී තිබුණි.

(ආ) සංස්ථාවේ ජංගම අනුපාතය 0.52:1 ක් හා ක්ෂණික අනුපාතය 0.5:1 ක් වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ මසුන්, අයිස්, ශීතාගාර හා ටින්කළ මසුන් යන අංශයන්හි දළ ලාභ ආන්තිකය හා ශුද්ධ ලාභ ආන්තිකය පහත පරිදි විය.

| විස්තරය | දළ ලාභ ආන්තිකය 2015 | දළ ලාභ ආන්තිකය 2014 | ශුද්ධ ලාභ ආන්තිකය 2015 | ශුද්ධ ලාභ ආන්තිකය 2014 |
|---|---|---|---|---|
| | % | % | % | % |
| මසුන් ආදායම | 15.32 | 18.19 | (4.36) | 4.06 |
| අයිස් ආදායම | 77.75 | 56.51 | (91.64) | (84.60) |
| ශීතාගාර ආදායම | 97.42 | 96.47 | (52.09) | (22.47) |
| ටින්කළමසුන් ආදායම | (26.54) | 4.33 | 15.04 | 45.15 |

පහත සඳහන් නිරික්ෂණ කරනු ලැබේ.

(i) මත්ස්‍ය විකුණුම් ආදායමේ දළ ලාභ ආන්තිකය සියයට 2.87 කින් හා ශුද්ධ ලාභ ආන්තිකය සියයට 8.42 කින් ඉකුත් වර්ෂයට සාපේක්ෂව අඩුවී තිබුණි. මේ සඳහා විකුණුම් ආදායම අඩුවීමට සාපේක්ෂව විකුණුම් පිරිවැය අඩුනොවීම හේතු වී තිබුණි.

(ii) අයිස් යන්ත්‍රාගාරවල විකුණුම් ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී සියයට 23 කින් අඩු වී ඇතත්,විකුණුම් පිරිවැය ඊට ඉහළ ප්‍රතිශතයකින් එනම් සියයට 61 කින් අඩුවීම මත මෙම වසරේ දළ ලාභ අනුපාතය සියයට 21 කින් වර්ධනය වී තිබුණි.

(iii) ටින්කළ මසුන් අංශයෙහි සමාලෝචිත වර්ෂය තුළ බාහිර විකුණුම් සිදු නොකිරීම හා විකුණුම් පිරිවැයට වඩා අඩු මිලකට සංස්ථාවේ අනෙකුත් විධායකයන්ට ටින්කළ මසුන් අලෙවි කිරීම මත සහ අවසාන තොග නොපැවතීම හේතුවෙන් ඉකුත් වසරට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දළ අලාභ අනුපාතිකය සියයට 30.8 කින් වර්ධනය වී තිබුණි.

(iv) මත්ස්‍ය විකුණුම් හා ශීතාගාර යන අංශයන්හි ශුද්ධ ලාභ අනුපාතිකය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ පිළිවෙලින් සියයට 8.4 කින් හා සියයට 30 කින් පිරිහීමට එම අංශයන්හි පරිපාලන වියදම් පිළිවෙලින් සියයට 20 කින් හා සියයට 4 කින් වැඩිවීම හේතු වී තිබුණි.

(v) ටින්කළ මසුන් අංශයට අදාල බදු කුලී ආදායම මෙම වර්ෂයේ සියයට 60 කින් අඩුවීම සහ දළ අලාභයක් ලැබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ ශුද්ධ ලාභ අනුපාතය අඩුවී තිබුණි.

(vi) සමාලෝචිත වර්ෂය තුළ ආදායම මත පරිපාලන වියදම් සියයට 27 ක් වන අතර, බෙදාහැරීම් සඳහා සියයට 3 ක් පමණක් වැඩි වී තිබුණි. මේ අනුව සංස්ථාව ශුද්ධ අලාභ තත්ත්වයකට පත්වීමට ආයතනයේ පරිපාලන වියදම් අසාමාන්‍ය ලෙස ඉහළයාම හේතු වී ඇති බව නිරීක්ෂණය විය.

## 3.3 ආයතනයට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි

සමාලෝචිත වර්ෂය අවසානය වනවිට සංස්ථාවට එරෙහිව බාහිර පාර්ශවයන් විසින් පවරන ලද නඩු 17 ක් විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 4.1 කාර්යසාධනය

------------------

1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ 1964 ඔක්තෝබර් 01 දිනැති අංක 14/186 දරන අති විශේෂ ගැසට් පත්‍රය හා 2011 ජුනි 30 දිනැති අංක 1712/ 21 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් ස්ථාපිත කර තිබූ ලංකා ධීවර සංස්ථාවේ ආරම්භක අරමුණු පහත පරිදි සාරාංශ කර දැක්වේ.

- සෘජුව හෝ බලයලත් ඒජන්තවරු මාර්ගයෙන් දියඹ මුහුදේ ට්‍රෝලර් යාත්‍රා යොදා මසුන් මැරීමේ කටයුතු , සකස්කිරීමේ කටයුතු සහ තොග වශයෙන් හෝ සිල්ලර වශයෙන් අලෙවි කිරීමේ හෝ බෙදාහැරීමේ කටයුතු ඉටු කිරීම, ශීත කාමර ඇතුළු ධීවර වරායන් හා නැංගුරම් පොලවල් ඉදිකිරීම, නඩත්තු කිරීම, මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදනයන් ආනයනය කිරීම හා අපනයනය කිරීම, ධීවර කර්මාන්තය සඳහා ආම්පන්න උපකරණ හා වෙනත් අවශෝෂපකරණ ආනයනය කිරීම හා විකිණීම.

- ධීවර දෙපාර්තමේන්තුව හෝ රජයේ වෙනයම් දෙපාර්තමේන්තුවක් සඳහා සහ ඒ වෙනුවෙන් ධීවර කර්මාන්තය සංවර්ධනයට අදාල කටයුතුවල නියැලීම, ධීවර කර්මාන්තය සඳහා බෝට්ටු හා වෙනත් කුඩා යාත්‍රා තැනීම, ධීවර බෝට්ටු අළුත්වැඩියා කිරීමේ හා නඩත්තු කිරීමේ පහසුකම් සැපයීම සහ ධීවර අවශෝෂපකරණ නිපදවීම හා විකිණීම.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, සීමාසහිත සී - නෝර් පදනම හා ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය යන ආයතන ධීවර අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කිරීමත් සමඟ සංස්ථාව වෙත පැවරී තිබූ ව්‍යවස්ථාපිත අරමුණු අතරින් එම ආයතනයන්හි විෂය පථයට අයත් අරමුණු එම ආයතන වෙත පැවරී තිබීම හේතුවෙන් ධීවර සංස්ථාව එම අරමුණු කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි. කෙසේ වෙතත් ධීවර සංස්ථාව ස්ථාපිත කිරීමේදී සංස්ථාව වෙත පැවරී තිබූ එම අරමුණු සංශෝධනය කිරීම සම්බන්ධව අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(ආ) සංස්ථාව දිගින් දිගටම අලාභ ලැබීමත්, උග්‍ර මූල්‍ය අර්බුදයකට මුහුණපෑමත් නිසා සංස්ථාවේ සංයුක්ත සැලැස්මේ ඇතුළත් පහත සඳහන් ඉලක්ක ලඟා කරගැනීමට නොහැකි වී තිබුණි.

- ඵලදායී සංවිධානයක් වශයෙන් දළ දේශීය නිෂ්පාදනයට උපරිම දායකත්වයක් ලබාදීම.

- මසුන් නිෂ්පාදනය, සැකසුම් කිරීම සහ අලෙවි කිරීම සඳහා වගකීමෙන් හා සැලකීමෙන් යුක්ත අර්ථාන්විත වීම.

- ධීවර කාර්මිකයාගේ ආර්ථික හැකියාව ශක්තිමත් කිරීම හා එහි නිෂ්පාදන ධාරිතාව නගා සිටුවීම මත ඉහළ සංවර්ධනයක් ලබා ගැනීම.

- නවීන තාක්ෂණය යොදා ගනිමින් සාධාරණ මිලකට උසස් තත්ත්වයෙන් යුත් මසුන් සහ වටිනාකම එකතුකරන ලද නිෂ්පාදනයන්හි නිෂ්පාදන හා අලෙවි කටයුතුවල නිරත වීම.

(ඇ) කාර්යසාධන වාර්තාවට අනුව සමාලෝචිත වර්ෂය තුළ සංස්ථාවේ ප්‍රධාන ක්‍රියාකාරකම්හි ඉලක්ක ඉටුකරගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) මසුන් මෙට්‍රික් ටොන් 9,708 ක් මිලදීගැනීම සඳහා රු.මිලියන 3125.16 ක මුදලක් ප්‍රතිපාදනය කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු. මිලියන1186.93 ක් වැයකර මත්ස්‍ය මෙට්‍රික් ටොන් 3443.79 ක් මිලදීගෙන තිබුණි.එම නිසා මත්ස්‍ය අලෙවි කළ ප්‍රමාණයද සැලසුම්කළ ප්‍රමාණයෙන් සියයට 38 ක් විය.

(ii) සමාලෝචිත වර්ෂයේ ළඟාකර ගැනීමට ඉලක්ක කළ අයිස් අලෙවිය හා ශීතාගාර ආදායමින් පිළිවෙලින් සියයට 23 හා සියයට 37 ක් පමණක් ළඟා කරගෙන තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2011 වර්ෂයේ දී සිදුවූ රු.2,558,028 ක ඇසුරුම් තොග වංචාව සම්බන්ධයෙන් හා 2014 අගෝස්තු 12 දින රු.මිලියන 13.9 ක හිඟණය ශේෂ ඇතිවන ආකාරයෙන් රෝහල් සඳහා මසුන් සැපයීම ඇතුළු චෝදනා 08 ක් සම්බන්ධයෙන් වගකිවයුතු පාර්ශවයන්ට එරෙහිව විධිමත් විනය පරීක්ෂණ පවත්වා අදාළ ඌනතාවය අයකර ගැනීමට හා උචිත ක්‍රියාමාර්ග ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුණද එකී තීරණයන් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) 2001 පෙබරවාරි මාසයේ රු.192,000 ක මුදල් වංචාවක් ඇතුළු වංචාවන් 12 කට චෝදනා ලැබ වැඩ තහනමට ලක්ව සිටි සංස්ථාවේ සහකාර කළමනාකරුවෙකු අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත විනය පරීක්ෂණයක් පැවැත්වීමකින් තොරව නැවත සේවයේ පිහිටුවා තිබුණි. මෙම නිලධාරියා වෙත පුහුණු වැඩසටහනකට සහභාගී වීම සඳහා විදේශ ගතවීමට ඉඩදී 2011 ඔක්තෝබර් 03 දින සිට II ශ්‍රේණිය විධායක කළමනාකාර තනතුරටද , 2011 ඔක්තෝබර් 20 දින සිට I ශ්‍රේණියේ විධායක කළමනාකාර තනතුරටද උසස් කරතිබුණි.

(ඇ) සංස්ථාවේ මෙහෙයුම් කළමනාකරු ලෙස කටයුතු කළ චෝදනා 11 කට වැරදිකරු වී වැඩ තහනම් කර තිබූ නිලධාරියෙකු විසින් ඉදිරිපත් කළ අභියාචනය සළකාබලා නැවත විනය පරීක්ෂණයකට යටත්ව තංගල්ල , කුරුණෑගල , මින්නේරිය , මහනුවර , හලාවත සහ මීගමුව යන විධායකයන්ගේ කළමනාකාර ධූරයන් සඳහා පත්කර තිබුණි.

(ඈ) සංස්ථාව විසින් භුක්ති විඳින අක්කර 09 පර්චස් 15.59 ක් වූ ඉඩම් 08 ක් , වසර 32 ක් තිස්සේ අදාල පාර්ශවයන් වෙතින් නීත්‍යානුකූලව පවරාගැනීමට කළමනාකරණය විසින් කටයුතු කර නොතිබුණි.

(ඉ) ධීවර සංස්ථාවේ සභාපති අමතන ලද 2013 මාර්තු 06 දිනැති අංක එන්පීසී/1/2/6 දරන ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශ ලිපිය අනුව රු.මිලියන 15 ක් වූ ත්‍රිකුණාමලය මසුන් අලෙවිසැල 2013 මාර්තු 09 දින සිට සංස්ථාව වෙත පවරාගන්නා ලෙස දන්වා තිබුණද , විගණිත දිනය වූ 2016 ජනවාරි දක්වාම පවරාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) ලංකා ධීවර සංස්ථාවෙහි 2015 දෙසැම්බර් 31 දිනට වෙළඳ මත්ස්‍ය භෞතික තොගය හා පොත් අගය සමඟ සැසඳීමේදී කිලෝග්‍රෑම් 5,939 ක ඌනතාවයක් නිරීක්ෂණය වූ අතර, එම ඌනතාවයට හේතු වූ කරුණු අනාවරණය කරගෙන අදාල පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(උ) 2009 වර්ෂයේදී ඌව පරණගම ප්‍රදේශයේ රිය මගින් මාළු අලෙවිකිරීම සඳහා ණයට විකිණීමේ පදනම මත බාහිර පාර්ශවයක් වෙත රු.874,255 ක් වටිනා මසුන් කිලෝග්‍රෑම් 2,117 ක් වෙනුවෙන් අයවිය යුතු සම්පූර්ණ හිඟ මුදලින් රු.427,276 ක් සංස්ථාව විසින් දැරීමටත්, ඉතිරි හිඟ මුදල වන රු.446,979 ක් වසරක කාලයක් තුල දී අදාළ බාහිර පාර්ශවය වෙතින් අයකර ගැනීමටත් 2012 නොවැම්බර් 12 දින පැවති 980 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී තීරණය කර තිබුණි. අධ්‍යක්ෂ මණ්ඩල තීරණයෙන් වසර 04 කට පසුවත් රු.200,000 ක මුදලක් පමණක් අයකරගෙන තිබුණි.

(ඌ) 2016 මැයි 19 දින පැවති 1015 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ගනු ලැබූ තීරණය පරිදි 2016 ජූලි 30 දින සිට ලංකා ධීවර සංස්ථාවේ ශීතාගාර සංකීර්ණය වසා දැමුවද, ශීතාගාර සංකීර්ණය තුළ ගබඩාකර තිබූ මසුන් තොග ඉවත් කිරීම පිළිබඳ උපදෙස් අදාළ පාර්ශව වෙත ලබාදී නොතිබුණි. මේ හේතුවෙන් 2009 වර්ෂයේ සිට ගබඩාකර තිබූ මසුන් කිලෝ 5,140 ක් හා ඉවතලන මසුන් කොටස් දින 12 ක කාලයක් වසාදැමූ ශීතාගාර සංකීර්ණය තුළ තිබීම හා නරක් වීමෙන් ඇතිවූ දුර්ගන්ධය හේතුවෙන් ප්‍රදේශවාසීන් අපහසුතාවයට පත්වීම හා මාධ්‍ය ආයතන වලින් අදාල සිදුවීම පිළිබඳව ප්‍රචාරය කිරීම නිසා එය සංස්ථාවේ කීර්තිනාමයට අහිතකර ලෙස බලපා තිබුණි.

(එ) බාහිර ආයතන හා පුද්ගලයින් විසින් ලබාදෙන මත්ස්‍ය තොග සඳහා ධීවර සංස්ථාවේ ශීතාගාරය තුළින් අධිශීතකරණ පහසුකම් ලබාදීමේදී ගාස්තු අය කර ගැනීම සම්බන්ධව නිසි ක්‍රමවේදයක් කළමනාකරණය විසින් හඳුන්වා දී නොතිබීම නිසා , 2016 අගෝස්තු 19 දිනට ශීතාගාර පහසුකම් ලබා දී බාහිර පාර්ශවයන්ගෙන් අයකරගැනීමට ඇති හිඟ ශේෂය තුළ ඇතුළත් වසර 02 කට වැඩි අයනොවී පැවති ශේෂය රු.4,014,847 ක් විය.

(ඒ) ඉතා සුළු කාලයකදී ඇතිවන වර්ෂාවකදී පවා ප්‍රධාන මාර්ගයේ සිට සංස්ථා භූමිය තුළට ගලාඑන අපවිත්‍ර ජලය බැසයාම සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස්කිරීමට සංස්ථාව අපොහොසත් වී තිබුණි. මේ හේතුවෙන් සංස්ථාවේ කාර්ය මණ්ඩලයට තම රාජකාරී කටයුතු බාධාවකින් තොරව ඉටු කිරීමට නොහැකි බව, ස්ථානීය පරීක්ෂණයේදී අනාවරණය විය. ඒ තුළින් සංස්ථාවේ සේවකයින්හට නොයෙකුත් රෝගී තත්ත්වයන් වැළඳීමට ඇති අවස්ථාද බැහැර කළ නොහැක. එසේම සංස්ථා භූමිය තුළ අපහරණය කළයුතු භාණ්ඩ ගොඩ ගසා තිබීම හා ඒ තුළට වැසි ජලය එකතුවීම හේතුකොටගෙන ඩෙංගු මදුරුවන් බෝවීමට අවශ්‍ය ඉඩකඩ ද සලසා තිබුණි.

**4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

**-----------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වනවිට මසුන් අලෙවිසැල් 250 ක් ඉදිකිරීමේ ඉලක්කගත අවශ්‍යතාවය සපුරාගැනීම සඳහා 2010 හා 2011 වර්ෂවලදී රාජ්‍ය බැංකුවකින් ලබාගෙන තිබූ රු.මිලියන 100 ක ණය මුදල සඳහා වාර්ෂිකව රු.මිලියන 38.5 ක පොළියක් ගෙවීමට සිදුවී තිබුණි.එසේ වුවද 2010 සිට 2014 දක්වා කාලය තුළ රු.මිලියන 47.2 ක් වැයකර අලෙවිසැල් 91 ක් පමණක් ඉදිකර තිබුණි. ශක්‍යතා අධ්‍යයනයකින් තොරව අලෙවි සැල් ස්ථාපනය කිරීම හේතුවෙන් ප්‍රමාණවත් අලෙවියක් නොමැතිවීම හා මහාමාර්ග පුළුල් කිරීම හේතුවෙන් අලෙවි සැල් ඉවත් කිරීමට සිදුවීම නිසා අලෙවිසැල් 49 ක් වසා දමා තිබුණි. එසේම ඉඩම් පවරාගැනීමකින් තොරව ඉදිකිරීම් සිදුකිරීම නිසා නීතිමය ගැටළු නිරාකරණය සඳහා අධික පිරිවැයක් දැරීමට සිදුවූ අවස්ථා නිරීක්ෂණය විය.

(ආ) මසුන් ඇල්ලීම සිදුකරන විධායකයන් 32 අතරින් 30 ක්ම අලාභ ලබන අතර සමාලෝචිත වර්ෂය තුළ ලබා ඇති මුළු අලාභය රු.138,040,828 ක් වූ අතර අයිස් යන්ත්‍රාගාර 08 ම සමාලෝචිත වර්ෂය තුළදී රු.33,364,965 ක මුළු අලාභයක් ලබා තිබුණි.

## 4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

සංස්ථාවට අයත් රු.12,211,084 ක් වූ වාහන 21 ක් මාස 06 සිට වර්ෂ 07 ක් දක්වා කාල පරාසයක් තුළ නිෂ්ක්‍රීයව පැවතුණි.

## 4.5 හඳුනාගන්නා ලද පාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ සංස්ථාව විසින් අයිරා පොළී ලෙස රු.7,597,811 ක් ගෙවා තිබුණි.

(ආ) පාරිතෝෂික දීමනා ප්‍රමාද කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.1,665,963 ක් පොළී මුදල් ලෙස ගෙවා තිබුණි.

## 4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

සංස්ථාවේ අනුමත සේවක සංඛ්‍යාව 745 ක් වුවද තථ්‍ය සේවක සංඛ්‍යාව 1,228 ක් වූයෙන් 483 ක සේවක අතිරික්තයක් පැවතුණි. අවශ්‍යතාවය නිශ්චිතව හඳුනා නොගෙන අතිරේක සේවකයන් බඳවාගැනීම නිසා සංස්ථාවේ සේවක පිරිවැය ඉහළයාම හේතුවෙන් සංස්ථාව අලාභ ලබන තත්ත්වයට පත්වී තිබුණි.

# 5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 ගිණුම් ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය පරිදි මුදල් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවද 2016 ජූලි 04 දින සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණි.

## 5.2 සංයුක්ත සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාව විසින් පිළියෙල කර තිබූ සංයුක්ත සැලැස්මෙහි "ස්ව සම්පත් කලාපය" සහ පිළිගත් ජාත්‍යන්තර රීතිවලට අනුකූලව ඉන් පිටත මසුන් ඇල්ලීමේ මෙහෙයුම්වල නිරත වීම, විදේශීය වෙළෙඳපල මසුන් විකිණීම හා දේශීය සහ විදේශීය නිෂ්පාදනයන් සහ බෙදාහරින්නන් නියෝජනය කිරීම යන අරමුණු ඉටුකර ගැනීම සඳහා ක්‍රමෝපාය සැලසුම් ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) සංස්ථාවෙහි 2014 – 2016 කාලපරිච්ඡේදය සඳහා වූ සංයුක්ත සැලැස්මෙහි ඉලක්ක වෙළඳපොල ලෙස අවසන් පාරිභෝගිකයන් පමණක් හඳුනාගෙන අලෙවිකරණ සැලසුම් ඉදිරිපත්කර තිබුණු අතර ආයතනික පාරිභෝගිකයන් ඉලක්ක වෙළඳපොලක් ලෙස හඳුනාගෙන නොතිබුණි.

(ඇ) සංයුක්ත සැලැස්මෙහි එක් එක් අරමුණු ඉටුකර ගැනීම සඳහා වූ ඉලක්ක හඳුනාගෙන නොතිබුණි.

## 5.3 ක්‍රියාකාරී සැලැස්ම

සංයුක්ත සැලැස්ම අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස්කළ යුතු වුවද සංයුක්ත සැලැස්මෙහි ඇතුළත්, ඉහළ ගුණාත්මකභාවයකින් යුතු පාරිභෝගික සේවාවක් පවත්වා ගැනීම, සම්පත් උපයෝජනය සහ කළමනාකරණයේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම හා මත්ස්‍ය මිල ස්ථායීකරණය කිරීමේ නියෝජිතයෙකු ලෙස කටයුතු කිරීම යන අරමුණු ඉටුකරගැනීම සඳහා ක්‍රියාකාරකම් සැලසුම්කර නොතිබුණි.

## 5.4 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන වාර්තා වලින් පෙන්වා දී ඇති අලාභයන් අයකිරීමට හා කරනු ලැබූ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට කළමණාකාරිත්වය කටයුතු කර නොතිබුණි.

## 5.5 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

සංස්ථාවේ අලෙවි අවශ්‍යතා වෙනුවෙන් අවශ්‍යවන කරවල මිලදීගැනීම සඳහා ලියාපදිංචි සැපයුම්කරුවන් 09 දෙනෙකුගෙන් මිල ගණන් කැඳවීම් කර තිබුණි. ඉන් අවම මිල ගණන් ඉදිරිපත් කළ සැපයුම්කරුගේ මිලගණන් වෙනස්කර ඉහළ මිල ගණන් ඉදිරිපත් කළ සැපයුම්කරුවකු වෙත සියලුම කොන්ත්‍රාත්තු ප්‍රදානය කර තිබීම හේතුවෙන් සංස්ථාවට රු.315,000 ක අලාභයක් සිදුවී තිබුණි.

## 5.6 නොවිසඳී ඇති විගණන ඡේද

පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් ලබා දී තිබූ පහත සඳහන් නියෝග ඉටුකර නොතිබුණි.

(අ) 2006 වර්ෂයේදී පෞද්ගලික සමාගමක් සමඟ ඇතිකරගත් බද්ධ ව්‍යාපාරයෙහි කටයුතු 2010 වර්ෂය වනවිට අකර්මන්‍යවීම නිසා එහි ආයෝජනය කර ඇති ඉඩමේ අයිතිය නැවත ලබාගැනීම.

(ආ) හිඟ ණයගැති ශේෂ අයකර ගැනීම සඳහා කටයුතු කිරීම.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සංස්ථාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍රය | | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) ආදායම් පාලනය | - | විධායකයන් විසින් කරන ලද මසුන් අලෙවිය වෙනුවෙන් ආදායම් අයකර ගැනීම දුර්වල තත්ත්වයක පැවතීම හා හිඟ ආදායම් වසර ගණනාවක සිට අයකරගැනීමට කටයුතු නොකිරීම. |
| (ආ) අයවැය පාලනය | - | අනුමත කරන ලද අයවැය ගත ගිණුම් විගණනයට ඉදිරිපත් නොකිරීම. |

| | | |
|---|---|---|
| (ඇ) තොග පාලනය | - | ප්‍රශස්ත තොග මට්ටම් තීරණය කර නොමැති වීම හා තොග නිකුත් කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දී නොමැති වීම. පාරිභෝජනයට නුසුදුසු තොග පැවතීම. |
| | - | මුදල් පසුවට ගෙවීමේ පදනම මත ශීතාගාර ගතකර තිබූ තොග නිකුත් කිරීම. |
| | - | තත්ත්වයෙන් බාල තොග ගබඩා කර තිබීම. |
| | - | දීර්ඝ කාලයක් තුළ ගබඩාකර ඉවත්කරගෙන නොමැති හා නිසි පරිදි ශීතාගාර ගාස්තු ගෙවීම් නොකල බාහිර පාර්ශවයන් වෙත නැවත ශීතාගාර පහසුකම් ලබාදීම. |
| | - | මසුන් සමඟ වෙනත් ආහාර ද්‍රව්‍ය ගබඩා කර තිබීම. |
| . | | |
| | - | සංස්ථාව සතු මසුන් වෙළඳපොළට නිකුත් කිරීමට නිසි ක්‍රමවේදයක් නොපැවතීම. |
| | - | පාරිභෝජනයට නුසුදුසු තත්ත්වයේ මසුන් හොඳ තත්ත්වයේ මසුන් සමඟ ගබඩාකර තිබීම. |